# සී/ස ලංකා නැව් සංස්ථාව

## (වරාය , නාවික කටයුතු හා ගුවන් සේවා අමාත්‍යාංශය)

# ඇබෑර්තු

පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසිභාවය හිමි අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද ඇති සුදුසු අපේක්ෂකයින් බඳවා ගැනීම සඳහා සංවර්ධන නිලධාරීන්/ අර්ධ රාජ්‍ය සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**ආශ්‍රිත නිලධාරි (වාණිජ්‍ය හා මෙහෙයුම්/නීති හා රක්ෂණ/කාර්මික/පරිපාලන/මානව සම්පත් )- MA 3-GR.III (ඇබෑර්තු 08)**

**ආශ්‍රිත නිලධාරි (වාණිජ්‍ය හා මෙහෙයුම්/ නීති හා රක්ෂණ /කාර්මික/පරිපාලන)**

**බාහිර අපේක්ෂකයින්:**

**අධ්‍යාපන සුදුසුකම්:**
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක තනතුරට අදාල වන ව්‍යාපාර කළමනාකරණය/ විද්‍යාව/වාණිජ්‍ය/අලෙවිකරණය/නාවික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය

(ලොජිස්ටික් සහ ප්‍රවාහනය පිළිබඳ උපාධිය, වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනයේ පූර්ණ / අර්ධ වශයෙන් සමත් බව අමතර සුදුසුකමක් වේ).

**ආශ්‍රිත නිලධාරි (මානව සම්පත් )**

**බාහිර අපේක්ෂකයින්:**

**අධ්‍යාපන සුදුසුකම්:**
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධිය

**වැටුප් පරිමාණය :** MA-3 – 2016 : රු. (32,200-10×445-11×660-10×730-5×750-54,960)
සංශෝධිත වැටුප අනුව, 2020/01/01දිනට MA -3 කාණ්ඩයේ III ශ්‍රේණියේ මූලික වැටුප රු. 32, 200/- ක්වේ. ඉහත වැටුපට අමතරව රජයට අයත් ව්‍යවසායන් සඳහා අනුමත සියළුම අනෙකුත් අදාළ දීමනා ගෙවනු ලැබේ.

**වයස් සීමාව:** වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පරිවාස කාලය** : බාහිර අයදුම්කරුවන් සඳහා අවුරුදු 03ක් අභ්‍යන්තර අයදුම්කරවන් සඳහා වසර 1 කි.

**ප්‍රතිලාභ**

1. සේ.අ.අ. / සේ.නි.භා.අරමුදලට සංස්ථාවේ දායකත්වය
2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගත කිරීම් සඳහා රක්ෂණ ආවරණය
3. සම්පූර්ණ පුද්ගල සහ අනතුරු රක්ෂණ ආවරණය
4. භාවිතා නොකල වෛද්‍ය නිවාඩු වලට ගෙවීම්
5. වාර්ෂික ප්‍රසාද දීමනාඅදාල පරිදි
6. සහනශීලී නියමයන් මත නිවාස ණය සහ සේවක මණ්ඩල ණය
7. අනුග්‍රාහක වාහන ණය

<u>**පොදු උපදෙස්**</u>

- සියලුම අයදුම්පත් තමා විසින් සත්‍ය බවට සහතික කළ අධ්‍යාපන / වෘත්තීය සහතිකපත්වල පිටපත් සමඟ උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් සහතිකවල පිටපත් සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව **ලියාපදිංචි තැපැලෙන් මෙම දැන්වීම පළවූ දින සිට දින 10 ක් ඇතුළත සභාපති, සී/ස ලංකා නැව් සංස්ථාව, අංක 27, MICH ගොඩනැගිල්ල, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් මාවත), කොළඹ 01** වෙත ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පත එවන ලිපිකවරයේ වම්පස කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.

- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.

- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

**ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

---

**සභාපති**

**සීමාසහිත ලංකා නැව් සංස්ථාව**

**අංක 27,MICH ගොඩනැගිල්ල**

**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය)**

**කොළඹ 01**

**වැඩි විස්තර සඳහා- 011 239 4624, 202 දිගුව, නීති/රක්ෂණ හා මානව සම්පත් අංශය**

**දිනය : 2023.04.04**